සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved]

නව නිර්දේශය / New Syllabus

**NEW**

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2020
General Certificate of Education (Adv. Level) Examination, 2020

ව්‍යාපාර අධ්‍යයනය II
Business Studies II

**32 S II**

පැය තුනයි
Three hours

අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි
Additional Reading Time - 10 minutes

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේදී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.

උපදෙස්:

* එක් කොටසකින් අවම වශයෙන් ප්‍රශ්න **දෙක** බැගින්වත් තෝරාගෙන, ප්‍රශ්න **පහකට** පිළිතුරු සපයන්න.

## I කොටස

1. විශේෂිත පුහුණු පාඨමාලාවක් අවසන් කිරීමෙන් පසු ආශා විසින් 'අම්සා' නමින් රූපලාවණ්‍යාගාරයක් ආරම්භ කර, එහි කළමනාකරු ලෙස අමර පත් කරන ලදී. රු. 500 000 ක ණය මුදලක් සහ ඇයගේ ඉතුරුම් මුදල් රු. 200 000 ක් ද මෙම ව්‍යාපාරය සඳහා ආශා විසින් ආයෝජනය කරනු ලැබී ය. ආශා විසින් රු. 600 000 ක් වටිනා ගොඩනැගිල්ලක් මිල දී ගත් අතර, ඉතිරිය තම ව්‍යාපාරය මගින් ඉහළ ගුණත්වයෙන් යුතු සේවාවක් සැපයීම සඳහා අවශ්‍ය නවීන උපකරණ ආනයනය කිරීම සඳහා වැය කරන ලදී. ඇය ඇතුළු පුහුණු කාර්ය මණ්ඩලය තම ගනුදෙනුකරුවන්ගේ පහසුව සලකා ඕනෑම අවස්ථාවකදී, ගනුදෙනුකරුවන්ගේ නිවසට පැමිණ හෝ රූපලාවණ්‍යාගාරයේදී හෝ තම සේවා සැපයීමට කටයුතු කරනු ලබයි.

(i) මෙම ව්‍යාපාරය පහත නිර්ණායක අනුව වර්ග කරන්න.

(අ) හිමිකාරීත්වය : ..............................

(ආ) අරමුණ : ..............................

(ඇ) පරිමාණය : ..............................

(ඈ) නිෂ්පාදන ආකාරය : .............................. (ලකුණු 04 යි)

(ii) (අ) ආශාගේ ව්‍යාපාරය ඇරඹූ කරනු ලබන්නේ පුද්ගල ව්‍යවසායකයෙක් ද නැතහොත් ප්‍රතිව්‍යාපාරිකයෙක් ද යන්න හේතුවෙන් විස්තර කරන්න. (ලකුණු 02 යි)

(ආ) ආශා විසින් මිල හැර, පාරිභෝගික ඉල්ලුම වැඩි කරගැනීම සඳහා යොදාගෙන ඇති වෙනත් උපක්‍රම **දෙකක්** නම්කර, ඒවා විස්තර කරන්න. (ලකුණු 02 යි)

(iii) (අ) මෙම ව්‍යාපාරයේ ශක්තීන් **දෙකක්** හා දුර්වලතා **දෙකක්** දක්වන්න. (ලකුණු 02 යි)

(ආ) ආශාගේ ව්‍යාපාරය ආශ්‍රිත කර්මාන්තය ආර්ථික සංවර්ධනයට දායක වන ආකාර **දෙකක්** විස්තර කරන්න. (ලකුණු 02 යි)

(iv) (අ) මෙවැනි ව්‍යාපාරවල ඇතිවිය හැකි අවදානම් **හතරක්** සඳහන් කරන්න. (ලකුණු 02 යි)

(ආ) ආශාගේ ව්‍යාපාරයේ ව්‍යවසායකත්වයට අමතරව යොදවා ඇති සම්පත් **හතරක්** උදාහරණ සහිතව ලියන්න. (ලකුණු 02 යි)

(v) ආශාගේ ව්‍යවසායකත්ව ගුණාංග සහ කුසලතා තවදුරටත් වර්ධනය කරගත හැකි ආකාර **හතරක්** පැහැදිලි කරන්න. (ලකුණු 04 යි)

(මුළු ලකුණු 20 යි)

[දෙවැනි පිටුව බලන්න.

2\. (i) (අ) වෙළෙඳ විෂමාචාර පිළිබඳව ඔබට පැමිණිලි කළ හැකි ශ්‍රී ලංකාවේ ස්ථාපිත ආයතන **හතරක්** නම් කරන්න. (ලකුණු 02 යි)

(ආ) වෙළෙඳුන් විසින් සිදු කරනු ලබන වෙළෙඳ විෂමාචාර **දෙකක්** කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 02 යි)

(ii) (අ) 'විධිමත් සංවිධානයක්' යනුවෙන් අදහස් කරන්නේ කුමක් දැයි විස්තර කරන්න. (ලකුණු 02 යි)

(ආ) සීමිත පොදු සමාගම්වල ලක්ෂණ **හතරක්** දක්වන්න. (ලකුණු 02 යි)

(iii) (අ) 'වරලත් ව්‍යාපාර' යන්න නිර්වචනය කරන්න. (ලකුණු 02 යි)

(ආ) ලැයිස්තුගත පොදු සමාගමක් ලැයිස්තුගත නොකළ පොදු සමාගමකින් වෙනස් වන්නේ කෙසේ දැයි විස්තර කරන්න. (ලකුණු 02 යි)

(iv) කීර්ති, දේශීය සැපයුම්කරුවන්ගෙන් මිලට ගනු ලබන මසුන් අපනයනය කිරීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යනු ලැබේ. කොවිඩ්-19 වසංගතය හේතුවෙන් මසුන් කිලෝවක අපනයන මිල ඇ.ඩො. 16 සිට ඇ.ඩො. 06 දක්වා අඩු විය. මේ නිසා කීර්ති මහතා තම ව්‍යාපාරය වසා දැමීමට තීරණය කළ නමුත් සේවකයින් සහ ප්‍රදේශවාසීන් විසින් එම තීරණය කෙරෙහි විරෝධයක් දැක්වී ය.

(අ) මෙම ව්‍යාපාරයේ 'සමාජ වගකීම' යනුවෙන් අදහස් කරනුයේ කුමක් ද? (ලකුණු 01 යි)

(ආ) ඉහත ව්‍යාපාරය කෙරෙහි උනන්දුවන පාර්ශ්ව **තුනක්** නම් කර, එක් එක් පාර්ශ්වය එසේ උනන්දු වීමට බලපානු ලබන එක් හේතුව බැගින් දක්වන්න. (ලකුණු 03 යි)

(v) තාර්කික පාරිභෝගිකයෙකු වෙළෙඳපොළ තුළ හැසිරෙන ආකාරය කරුණු **හතරක්** ඇසුරෙන් පැහැදිලි කරන්න. (ලකුණු 04 යි)

(මුළු ලකුණු 20 යි)

3\. රජය මගින් පවත්වාගෙන යනු ලබන ගුවන් සමාගමක් තම වෙළෙඳපොළ කොටස වර්ධනය කරගැනීමේ අපේක්ෂාවෙන් පෞද්ගලික ගුවන් සමාගමක් වන 'එයාර් ඇල්ෆා' සමග සංයෝජනය වන ලදී.

(i) (අ) 'ව්‍යාපාර ඒකාබද්ධවීම' යනුවෙන් අදහස් කරන්නේ කුමක් ද? (ලකුණු 02 යි)

(ආ) ඉහත සමාගම් දෙක අතර සිදු වූ ඒකාබද්ධවීම කුමන සංයෝජනයට අදාළ දැයි නම් කර, එම සංයෝජන වර්ගය පිළිබඳව විස්තර කරන්න. (ලකුණු 02 යි)

(ii) (අ) කල්බදු සමාගම් මගින් ව්‍යාපාරිකයකුට හිමිවන වාසි **හතරක්** ලියන්න. (ලකුණු 02 යි)

(ආ) ශ්‍රී ලංකා මහ බැංකුවේ නියෝජ්‍යායතන කාර්යයන් **හතරක්** දක්වන්න. (ලකුණු 02 යි)

(iii) (අ) බලපත්‍රලාභී වාණිජ බැංකු හා බලපත්‍රලාභී මුදල් සමාගම් අතර ඇති වෙනස්කම් **දෙකක්** විස්තර කරන්න. (ලකුණු 02 යි)

(ආ) 'ලංකා සෙට්ල්' (Lanka Settle) පද්ධතියේ ප්‍රධාන ගෙවීම් පියවීම් පද්ධති **දෙක** පිළිබඳව විස්තර කරන්න. (ලකුණු 02 යි)

(iv) (අ) ගුවන් ප්‍රවාහනය, ආර්ථිකයට වැදගත් වන ආකාරය පිළිබඳව හේතු **දෙකක්** දක්වමින් විස්තර කරන්න. (ලකුණු 02 යි)

(ආ) ශ්‍රී ලංකාවේ මහාමාර්ග ප්‍රවාහන අංශයේ දැකිය හැකි වර්තමාන ප්‍රවණතා **දෙකක්** උදාහරණ සහිතව විස්තර කරන්න. (ලකුණු 02 යි)

(v) සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර නිර්වචනය කිරීමේදී 'ප්‍රමාණාත්මක සාධක' යනුවෙන් අදහස් කරන්නේ කුමක් දැයි පැහැදිලි කර, ඒ සඳහා උදාහරණ **දෙකක්** සපයන්න. (ලකුණු 04 යි)

(මුළු ලකුණු 20 යි)

4\. (i) (අ) 'ආවරණ ලිපිය' යනුවෙන් අදහස් කරන්නේ කුමක් ද? (ලකුණු 02 යි)

(ආ) දකුණු ආසියානු කලාපීය සහයෝගිතා සංගමයේ (SAARC) සහයෝගිතා කටයුතු ක්ෂේත්‍ර **හතරක්** නම් කරන්න. (ලකුණු 02 යි)

(ii) (අ) සේවක අර්ථසාධක අරමුදල (EPF) සඳහා දායකත්වය ලබා දිය යුතු පාර්ශ්ව නම් කර, ඔවුන් දැරිය යුතු අවම දායකත්ව ප්‍රතිශත සඳහන් කරන්න. (ලකුණු 02 යි)

(ආ) රක්ෂණය කළ **නොහැකි** අවදානම් හඳුනාගත හැකි ආකාර **හතරක්** දක්වන්න. (ලකුණු 02 යි)

(iii) (අ) චෙක්පතක් ලිවීමේදී සැලකිලිමත් විය යුතු කරුණු **හතරක්** සඳහන් කරන්න. (ලකුණු 02 යි)

(ආ) සීමාකාරී පිටසනය ඇති වැදගත්කම හේතු **දෙකක්** ඇසුරෙන් කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 02 යි)

(iv) (අ) 'පොදු (General) වෙළඳ නාම රක්ෂණය' යනුවෙන් අදහස් කරන්නේ කුමක් ද? (ලකුණු 01 යි)

(ආ) ව්‍යාපාර කටයුතු සඳහා සන්නිවේදනයේ වැදගත්කම හේතු **තුනක්** ඇසුරෙන් පැහැදිලි කරන්න. (ලකුණු 03 යි)

(v) ව්‍යාපාරයකට 'තීරු සංකේත' (Barcodes) වැදගත් වන්නේ ඇයි දැයි හේතු **හතරක්** ඇසුරෙන් පැහැදිලි කරන්න. (ලකුණු 04 යි)

(මුළු ලකුණු 20 යි)

## II කොටස

5\. (i) (අ) 'සංවිධානයක්' යනු කුමක් දැයි විස්තර කරන්න. (ලකුණු 02 යි)

(ආ) 'ඵලදායීතාවය' හා 'කාර්යක්ෂමතාවය' අතර ඇති සම්බන්ධතාව විස්තර කරන්න. (ලකුණු 02 යි)

(ii) (අ) සංවිධානයක් විමධ්‍යගතකරණය කිරීමෙන් ලැබෙන වාසි **දෙකක්** හා අවාසි **දෙකක්** ලියන්න. (ලකුණු 02 යි)

(ආ) පාලන ක්‍රියාවලියේ වැදගත්කම පිළිබඳව හේතු **හතරක්** සඳහන් කරන්න. (ලකුණු 02 යි)

(iii) (අ) නිෂ්පාදිතයක 'එකතුකළ අගය' යනු කුමක් ද? (ලකුණු 02 යි)

(ආ) 'කුට් පිරියත' යන්න උදාහරණයක් ඇසුරෙන් කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 02 යි)

(iv) (අ) සැලසුම්කරණ ක්‍රියාවලියේ සම්පත් විශ්ලේෂණය මගින් ඇති ප්‍රයෝජන **දෙකක්** සඳහන් කරන්න. (ලකුණු 01 යි)

(ආ) අග්‍ර කළමනාකරුවන් සඳහා සංකල්පනාත්මක කුසලතා වඩාත් වැදගත් වන්නේ ඇයි දැයි හේතු **දෙකක්** දක්වමින් පැහැදිලි කරන්න. (ලකුණු 03 යි)

(v) සරවනාස් පාවහන් නිපදවීමේ සමාගමට අදාළව සත්‍ය හා පුරෝකථනය කරන ලද තොරතුරු පහත වගුවේ දැක්වේ.

| විස්තරය | 2020 (සත්‍ය) | 2021 (පුරෝකථන) |
|---|---|---|
| පාවහන් යුගල (ඒකක) | 500 | 1 000 |
| ස්ථාවර පිරිවැය | රු. 212 000 | 50% කින් වැඩි වේ |
| විචල්‍ය පිරිවැය (පාවහන් යුගලයක) | රු. 200 | රු. 200 |
| විකුණුම් මිල (පාවහන් යුගලයක) | රු. 730 | රු. 730 |

2021 වර්ෂය සඳහා පහත දෑ ගණනය කරන්න.

(අ) මුළු නිෂ්පාදන පිරිවැය

(ආ) පාවහන් යුගලයක නිෂ්පාදන පිරිවැය

(ඇ) සමච්ඡේදන ලක්ෂ්‍යයේ ඒකක ප්‍රමාණය

(ඈ) 2020 වර්ෂයට සාපේක්ෂව සමච්ඡේදන ලක්ෂ්‍යයේ ඒකක ප්‍රමාණයෙහි වෙනස (ලකුණු 04 යි)

(මුළු ලකුණු 20 යි)

6\. (i) (අ) නව තාක්ෂණය භාවිත කිරීමේදී ව්‍යාපාරයකට ඇතිවිය හැකි ගැටලු **හතරක්** සඳහන් කරන්න. (ලකුණු 02 යි)

(ආ) විශේෂිත භාණ්ඩවලින් සාප්පු භාණ්ඩ වෙනස් වන ආකාරය උදාහරණයක් ඇසුරෙන් විස්තර කරන්න. (ලකුණු 02 යි)

(ii) වෙළෙන්දෙකු විසින් තරඟකරුවන්ගේ මිලට වඩා 20% ක් අඩුවෙන් තම භාණ්ඩ මිල නියම කරනු ලැබේ.

(අ) ඉහත ආකාරයේ මිල කිරීමේ ක්‍රමයක මූලික අරමුණ කුමක් ද? (ලකුණු 01 යි)

(ආ) එවැනි මිල ක්‍රමයක් මගින් වෙළෙන්දාගේ දළ ලාභයට ඇතිවන බලපෑම කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 03 යි)

(iii) (අ) වෙළෙඳ ප්‍රවර්ධනය මගින් ව්‍යාපාරයකට ලබාගත හැකි ප්‍රතිලාභ **හතරක්** සඳහන් කරන්න. (ලකුණු 02 යි)

(ආ) ''පාරිභෝගික භාණ්ඩයේ ස්වභාවය අනුව බෙදාහැරීමේ මාර්ග වෙනස් වේ.'' මෙම ප්‍රකාශය උදාහරණ **දෙකක්** ඇසුරෙන් විස්තර කරන්න. (ලකුණු 02 යි)

(iv) (අ) මූල්‍ය කළමනාකරණයෙහි අරමුණු **හතරක්** දක්වන්න. (ලකුණු 02 යි)

(ආ) ඵලදායී මූල්‍ය කළමනාකරණය මගින් කොටස්කරුවන්ට ලබාගත හැකි වාසි **දෙකක්** විස්තර කරන්න. (ලකුණු 02 යි)

(v) වෙළෙඳපොළ ඛණ්ඩනය මගින් ව්‍යාපාරිකයෙකුට ලබාගත හැකි ප්‍රයෝජන **හතරක්** පැහැදිලි කරන්න. (ලකුණු 04 යි)

(මුළු ලකුණු 20 යි)

[හතරවැනි පිටුව බලන්න.

7. (i) සපයා ඇති තොරතුරු ඇසුරෙන් පහත සඳහන් එක් එක් අනුපාත ගණනය කරන්න.

| | රු. |
|---|---|
| ශුද්ධ ලාභය (බදු පෙර) | 60 000 |
| වරණීය ලාභාංශ | 15 000 |
| වරණීය කොටස් | 200 000 |
| සාමාන්‍ය කොටස් | 300 000 |
| විකුණුම් | 100 000 |
| ගෙවිය යුතු ආදායම් බදු | 10 000 |
| ණය පොලිය | 5 000 |

(අ) ශුද්ධ ලාභ අනුපාතය
(ආ) හිමිකම් මත ප්‍රතිලාභ අනුපාතය
(ඉ) ණය හිමිකාරීත්ව අනුපාතය
(ඊ) පොලී ආවරණ අනුපාතය (ලකුණු 04 යි)

(ii) (අ) 'සංචිත ප්‍රාග්ධනීකරණය' යනු කුමක් ද? (ලකුණු 02 යි)
(ආ) රජයේ සුරැකුම්පත් හි ආයෝජනය කිරීමෙන් ආයෝජකයෙකු හට ඇතිවන වාසි **හතරක්** දක්වන්න. (ලකුණු 02 යි)

(iii) (අ) ආයෝජකයන් හට කොටස් මිල දර්ශක වැදගත්වීමට හේතු **හතරක්** සඳහන් කරන්න. (ලකුණු 02 යි)
(ආ) තාවකාලික පදනම මත සේවකයන් බඳවා ගැනීමෙන් ව්‍යාපාරයකට අත්වන වාසි **දෙකක්** විස්තර කරන්න. (ලකුණු 02 යි)

(iv) (අ) කාර්යසාධනය ඇගයීමෙන් පසු සේවක සංචලනය සිදුකළ හැකි ආකාර **හතරක්** දක්වන්න. (ලකුණු 02 යි)
(ආ) 'සේවක ප්‍රවාසිතාව' හා 'සේවක පිරිවැටුම' අතර වෙනස දක්වන්න. (ලකුණු 02 යි)

(v) ආයතනයක මානව සම්පත් ඉල්ලුම කෙරෙහි බලපෑම් ලබන සාධක **හතරක්** පැහැදිලි කරන්න. (ලකුණු 04 යි)
(මුළු ලකුණු 20 යි)

8. (i) (අ) අන්තර්ජාල බැංකු සේවාව මගින් ව්‍යාපාරිකයෙකු හට ඇතිවන වාසි **දෙකක්** සහ අවාසි **දෙකක්** දක්වන්න. (ලකුණු 02 යි)
(ආ) 'පරිගණක ආරක්ෂක තර්ජන' යන්න හඳුන්වා, එවැනි තර්ජන **දෙකක්** නම් කරන්න. (ලකුණු 02 යි)

(ii) (අ) ඵලදායී තොරතුරු පද්ධතියක් මගින් ඉටුකර ගැනීමට අපේක්ෂිත කාර්යයන් **හතරක්** සඳහන් කරන්න. (ලකුණු 02 යි)
(ආ) සේවකයින් විසින් දැනුම් මට්ටමේ තොරතුරු පද්ධතිය භාවිත කරන්නේ කුමන අරමුණක් සඳහා දැයි විස්තර කරන්න. (ලකුණු 02 යි)

(iii) (අ) මූල්‍ය සැලැස්මක් ව්‍යාපාරයකට වැදගත් වන ආකාරය කරුණු **දෙකක්** ඇසුරෙන් විස්තර කරන්න. (ලකුණු 02 යි)
(ආ) ඇස්තමේන්තුගත මුදල් ප්‍රවාහය ව්‍යවසායකයකු සඳහා වැදගත් වන්නේ කෙසේ දැයි හේතු **හතරක්** ඇසුරෙන් කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 02 යි)

(iv) (අ) ව්‍යාපාරයක කාරක ප්‍රාග්ධනය වර්ධනය කරගත හැකි ආකාර **දෙකක්** ලියන්න. (ලකුණු 01 යි)
(ආ) කොළඹ කොටස් හුවමාරුවේ ලැයිස්තුගත සමාගමක් එම තත්ත්වයෙන් ඉවත් කිරීමට බලපාන හේතු **දෙකක්** දක්වා, ඒවා පැහැදිලි කරන්න. (ලකුණු 03 යි)

(v) පුද්ගලයෙක් තමන් සතු මුදලින් කොටසක් කොටස් වෙළෙඳපොළෙහි හෝ වාණිජ බැංකු ස්ථාවර තැන්පතු සඳහා ආයෝජනය කිරීමට අපේක්ෂා කරයි. එම විකල්ප ආයෝජන මාර්ග දෙකෙහි ඇති වාසි **දෙකක්** හා අවාසි **දෙකක්** පැහැදිලි කරන්න. (ලකුණු 04 යි)
(මුළු ලකුණු 20 යි)

* * *